ක්‍රි. ව. 2014 මාර්තු 10 සඳුදා
06 වෙළුම - 18 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## පුංචි අපිත් කුරුසියේ මග යමින්

# චතාරිකයට සූදානම් වෙමු !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611

ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com

වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# චතාරිකය තුළ පුංචි ඔබගේ කැපවීම (මිනිස් කම අවබෝධ කර ගැනිම තුළයි)

## ආදරණීය දුවේ පුතේ...

දැන් නැවතත් චතාරික කාලය එළඹිලා. චතාරික කාලය තුළදී අපි සැබවින්ම ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම හා මරණය සිහිපත් කරනවා. පාස්කු සමය උදාවත්ම ඔවුන් වහන්සේගේ උත්ථානය පිළිබඳව ගැඹුරුම විශ්වාසයේ ඇසකින් බලා මෙනෙහි කිරීම් වල නිරත වෙනවා. ආදර දුවේ, පුතේ, මෙවර චතාරිකය එළඹෙත්ම දහම් සාරය හා බැඳුනු එකී ආත්මීය මෙනෙහි කිරීම් වල යෙදෙමින් අප සමිඳාණන්ගේ ජිවිතය හා සමවීමට ගන්නා ආධ්‍යාත්මික ශක්තිය මෙන්ම බාහිර වශයෙන් අප උතුම් දහම ජීවත් කරවන පුද්ගල චර්යා ධර්ම මෙන්ම මිනිස් කම වෙතත් අප සිත් යොමු කළ යුතු වෙනවා.

අපි දැන් මෙහෙම කල්පනා කර බලමු. දහම හා බැඳී ජිවත් වන අපි මිනිසා ගැන දක්වන ආකල්පය කුමක්ද? මිනිසාගේ නිසඟ ගරුත්වය ගැනත් සැම අංශයකින්ම තම ජිවිතයේ අගය වැඩි කර ගැනීමට ඔහුට ඇති අයිතිය ගැනත් අප විශ්වාස කරන නමුත් සෑම මිනිසකුටම අපි එලෙස සලකනවාද? මේ චතාරික සමය තුළදී දැන් අපි අප තුළින්ම එලෙස විමසන්නට උත්සාහ කළ යුතු වෙනවා. අද සමහර පුද්ගලයින් අධි සුඛෝපභෝගි ජිවිත ගත කරන අතරම තවත් සමහරුන් ''මිනිස්'' යයි කිව නොහැකි තරම් වන තම ගරුත්වයට නොසරිලන ජිවිත ගත කරනවා.

ආදර දුවේ පුතේ, පුද්ගලයාගේ මානව ගරුත්වය පිළිබඳව කතෝලික අපි දැඩිව විශ්වාස කරනවා. දෙවි පියාණන් වහන්සේ මාංශගතවූයේ ඔවුන් වහන්සේ මිනිසා කෙරෙහි දැක්වූ සැලකිල්ල නිසාත්, ඔහුව සදතනික පාපයෙන් ගලවාගැනීමටත් බව අපි විශ්වස කරනවා. දෙවි පියාණන් වහන්සේ මානව ස්වරූපයක් තුළ සිට උකුත් වුයේ මිනිසාට දිව්‍යමය ස්වභාවය ලබා දීමටත් ඔහුගේ ජිවිතයේ මානව ස්වරූපය නැංවීමටත් නේද? ඒ වගේම ඔවුන් වහන්සේ උකුත් වුයේ මිනිසාව පාපයෙන් හා එහි ප්‍රතිඵල වලිනුත් ගලවා ගැනීමට බව අපි දැඩිව අදහනවා. මූලික වශයෙන් ඔවුන්වහන්සේ මෙලොව තම ජිවිතය පූජා කළේ මිනිසාව ඔහුගේ ආත්මාර්ථ කාමයෙන් මුදවා අන්‍යයන් වෙනුවෙන් කැපවූ ජිවිතයක් ඔහුට ගත කළ හැකි වනු සඳහා නේද?

ආදර දුවේ, පුතේ, අපේ සත් ගුණවත් ධර්මතා තුළින් මඳක් මේ ගැන නතර වෙලා කල්පනා කළොත් මොනවද අපට දැනෙන්නෙ? අභාග්‍යයකට, ආදර දුවේ පුතේ අපි අද විශ්වාස කරන්නේ පුද්ගලයින් සමහරකගේ ඇතුලාන්ත ගරුත්වය පිළිබඳව පමණයි. අනිත් අතට මානව ගරුත්වය යන්න මිනිසාගේ ආත්මයේ ගරුත්වයට පමණක් එම හැඟීම සීමා වෙලා. ඒ නිසා බාහිර වශයෙන් අද මිනිසුන් මිනිසුන්වම හෑල්ලු කරනවා. පාගා දමනවා. ඈත් කරනවා. මුලා කරනවා. මිනිස් කම චින්තනයේ හැඟීම්වලට පමණක් ඔවුන්ව සීමා කරමින් ඒ දේශපාලන දර්ශණයන් වලට අනිසි ලෙස ඔවුන්ව කොටු කරන්නට උත්සහ කරනවා. ආගම දහම තුළ අප අත් දකින්නේ සාමුහික ජිවිතයක්. අපිට තනිව ජීවත් වන්නට බැහැ. සාමුහිකතාවය, සහෝදරත්වය, පරහිතකාමී බව, සමානත්වය අපට මිනිසුන් වශයෙන් ජිවත් වන්නට අවශ්‍ය වන වටිනාකමේ සංකල්ප. ක්‍රිස්තුන් වහන්සේ මිනිසුන් අතරට ආවේ ඔවුන් අතරේ සමානාත්මතාවය වගා කරන්නටයි. මිනිසුන් අතරේ හා ඔවුන් සමග ජිවත් වීමටමයි ඔවුන් වහන්සේ මාංශගත වූයේ. ඒ ධර්මතාවය කෙතරම් දැඩිව අපි විශ්වාස කරනවද? එය අපේ ආත්මීය සංවේදි දහම් පණිවිඩයයි. එය සැබවින්ම කුරුස ගසෙන් අපි කථා කරන මානව දයාවයි.

එසේනම් ආදර දුවේ පුතේ, මේ චතාරිකය සැබවින්ම අර්ථවත් කරන්නට කිතුනු අපගේ ජිවිත කැඳවීම පිළිබඳව මෙන්ම මානව ගරුත්වය සමඟ බැඳෙන මිනිසියාව පිළිබඳවත් හොඳින් කල්පනා කරන්නට මඟක් දිස් කර ගන්නට ඕනා. මිනිසා හට දක්වන ගරුත්වය දෙවිඳුන් හට ලබා දෙන ගරුත්වය සේ අර්ථ ගන්වා සමාජය තුළ ජිවත් වන්නට කුඩා කල සිට අපි හොඳට අවබෝධයෙන් දහම තුළම ජීවත් වන්නට ඕනා. එම නිසා 2014 චතාරිකය උදාවත්ම ආරම්භ කරන මෙනෙහි කිරීම් තුළ ''චතාරිකය හා මානව ගරුත්වයට'' ඉඩ හසරක් ලබා දෙන්න. ඒ සංකල්පය ආධ්‍යාත්මික පණිවිඩයක් සේ මේ චතාරිකය තුළ ගෙන යන්නට ඔබත් කුරුසියේ පන්නරයක් ලබා ගන්න. ඔබට එය කළ හැකියි.

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




# කොයි කිතුනු සභාවත් හරිද?

**(1) ක්‍රිස්තු සභාවේ සභිකයෝ**

ක්‍රිස්තු අනුගාමිකයන් අතර කාන්තාවෝ ද වූහ. ''ස්ත්‍රීහු ද දුරින් බලා සිටියහ. ඔවුන් අතර, ගලීලයේ සිටිය දී උන් වහන්සේ පිරිවරා ගොස් උපස්ථාන කළ මග්දලාවේ මරියාත්, කුඩා ජාකොබ්ගේද ජෝසෙප්ගේ ද මව වන මරියාත්, සලෝමීත්, උන් වහන්සේ සමග ජෙරුසලෙමට ආ බොහෝ කාන්තාවෝත් සිටියහ. '' (මාර්ක් 15:40-41).

ශුද්ධාත්මයාණන් වැඩම කළ දින, පේදුරු තුමාගේ දේශනයෙන් පසු, තුන් දහක් පමණ ජනයා ක්‍රිස්තු අනු ගාමිකයන් වූ බව කියැවේ. ''එවිට ඔහුගේ වචනය පිළිගත් අය ස්නාපනය කරනු ලැබූහ. ඒ දවසේ දී තුන් දහක් පමණ පුද්ගලයෝ ඔවුන්ගේ සංඛ්‍යාවට එකතු කරන ලදහ.'' (ක්‍රියා 2:41). ඊට පසු ජෙරුසලමේද පිට ප්‍රදේශවල ද ක්‍රිස්තු භක්තික පිරිස වැඩි වර්ධනය වී ගියේය.

ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගයට වැඩම කරන්නට පෙර තම ශ්‍රාවකයන්ට දුන් අවසාන නියෝගය යුයේ ''ඔබ ගොස්, සකල ජාතීන් ගෝලයන් කරන්න'' යන්න ය (මතෙව් 28:19).මෙයින් පෙනෙන්නේ, සකල මනුෂ්‍යයන් තමන් වහන්සේගේ අනුගාමිකයන් වීම ක්‍රිස්තුන් වහන්සේගේ අභිප්‍රාය වූ බව ය. ඉතිහාසයෙන් පෙනෙන්නේ ද ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත කාලයේදී උන් වහන්සේට එක් වූ ගෝලයන් ටික දෙනෙකුගෙන් පටන් ගත් ක්‍රිස්තු අනුගාමික පිරිස, කෙමෙන් වර්ධනය වී, ජගත් ව්‍යාප්ත විශාල ජනතාවක් වූ බවය.

**(2) ක්‍රිස්තු සභාවේ නිලධාරීහු**

ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයන් ගෙන් දෙළොස් දෙනෙකු තෝරා, ඔවුන්ට විශේෂ නමක් ද, තත්ත්වයක්ද, යුතුකම් ද, බලතල ද දුන් බව බයිබලයේ සඳහන් වේ. ''පහන් වූ කළ උන්වහන්සේ සිය ගෝලයන් කැඳවා, ඔවුන් අතරෙන් ශ්‍රාවකයන් දෙළොස් දෙනෙකු තෝරා ගෙන, ඔවුන්ට අපෝස්තුලුවරුවර යැයි නම් තැබුසේක (ලූක් 6:13) අපෝස්තුළුවර යන ග්‍රීක් වචනයේ අර්ථය 'ප්‍රේරිතයෝ' හෙවත් යම් සේවාවක් සඳහා ''යවනු ලබන්නෝ' යන්න ය.

මෙසේ , නමින් ම ප්‍රකාශ වන්නේ ක්‍රිස්තුන් වහන්සේ විසින් ඔවුන් තෝරා පත් කරන ලද්දේ විශේෂ සේවාවක් සඳහා බවය. නව ගිවිසුමේ ග්‍රන්ථවල දෙළොස් දෙනාගේ නාමවලිය ද සඳහන් කර තිබීමෙන් පෙනෙන්නේ, ඔවුන්ගේ තත්ත්වය උසස් කොට සලකන ලද බවය. (මතෙව් 10:2-4, මාර්ක් 3:16-19, ලූක් 6:14-16 , ක්‍රියා1:13). අනික් ශ්‍රාවකයන්ගේ නම් එලෙස සඳහන් වී නැත අපෝස්තුලුවරුන් පත් කරන ලද්දේ කුමක් නිසාද යන්න මාර්ක් තුමා වැඩි විසිතුරු සහිත ව සඳහන් කරයි. ''ඔවුන් තමන් හා සමග සිටින පිණිසත්. සුබ අස්න දේශනා කිරීමට යවන පිණිසත්, යකුන් දුරු කිරීමේ බලය ඇතිව සිටින පිණිසත් ය''.(මාර්ක් 3:14-15). ඇත්ත වශයෙන්ම ඔවුන් ක්‍රිස්තුන් වහන්සේගේ සහචරයන් වී, නිතර උන් වහන්සේ සමග ගැවසුණු බව සුවිශේෂ ග්‍රන්ථවලින් පෙනේ.

**කිතු දහම මැනවින් දත්තෝ**

ක්‍රිස්තුන් වහන්සේට කිට්ටුව ගැවසීමෙ ප්‍රතිඵලයක් වශයෙන්, වඩා හොඳින් උන් වහන්සේ දැන හැඳින ගන්නටත්, උන් වහන්සේගේ ක්‍රියා දැක ගන්නටත්, උන් වහන්සේ සිතූ හැටියට ඒ දහමේ නියම අර්ථය වටහා ගන්නටත්, සෙසු අනුගාමිකයන්ට වඩා අපෝස්තුලුවරුන්ට අවකාශ ලැබිණ. ඒ හේතුවෙන්, ක්‍රිස්තු ධර්මය වඩා හොඳින් දත්තෝ ඔවුහු වූහ.

පසු කලෙක සුවිශේෂකවරුන් විසින් තමන්ගේ ග්‍රන්ථ වල සඳහන් කරන ලද්දේ, අපෝස්තුලුවරුන් විසින් ක්‍රිස්තුන් වහන්සේගෙන් ලැබ ගෙන සිටි ධර්මය යි. නො ලියන ලද කොටසක් වී නම්, එය දැන ගැන්මේ ප්‍රධාන මාර්ගය ද, අපෝස්තුළුවරු ම වූහ. ලියන ලද ධර්මය සම්බන්ධයෙන් වුව ද, ක්‍රිස්තුන් වහන්සේගේ සිතුම් අනුව සැබෑ අර්ථය දත හැකි වුයේ ඔවුන් මගිනි. මෙසේ ඔවුන්ට, කිතු සසුනේ විශේෂ වුත් වැදගත් වූත් ස්ථානයක් ක්‍රිස්තුන් වහන්සේ විසින්ම දෙන ලද ව පෙනී යයි.

ක්‍රිස්තුන් වහන්සේ විසින් ඔවුන් දම් දෙසුම් ද, රෝගීන් සුව කිරීම ද යකුන් දුරු කිරීම ද සඳහා යවන ලද බව සුවිශේෂ ග්‍රන්ථවල සඳහන් වේ. (මතෙව් 10:1-42, මාර්ක් 6:7-13, ලූක් 9:1-6). ඔවුන් දෙසු දහම පිළිගැනීම අත්‍යවශ්‍ය බව ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කරයි. (මතෙව් 10:14-15, මාර්ක් 6:11, ලූක්9:5). ''කවරකු වුව ද ඔබ පිළිගන්නේ වත් ඔබගේ වචන අසන්නේ වත් නැත් නම් ඒ ගෙදරින් හෝ ඒ නුවරින් හෝ නික්ම යන කල ඔබේ පාදවලින් දුවිලි ගසා දමන්න. සැබැවින් ම මම ඔබට කියමි. දේව විනිශ්චය දවසේ දී ඒ නුවරට වඩා සොදෙම් සහ ගොමෝරා රටට සහනය ලැබෙන්නේ ය.'' (මතෙව් 10:14-15). මෙසේ , ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මය මිනිසාට අත්‍යවශ්‍ය වන අතර, එය පැහැදිලිව හා නිවැරදි ව දැන ගන්නා මාර්ගය අපෝස්තුලු වරුය.

**ඩබ්ලිව්. එල්. ඒ. දොන් පීටර් පියතුමන්ගේ ග්‍රන්ථයක් ඇසුරිණි.**

**ඉදිරියට .......**

# කීකරුකම

**ජේසුගේ ආදරය වැඩියෙන්ම හිමිවන්නේ කුඩා ඔබටයි. ඒ නිසා ජේසුගේ දරුවන් විදිහට සැම විටම අනිත් අයට වඩා යහපත් ගුණධර්ම ඔයාලා ළඟ තිබිය යුතුය. ඒ නිසා යහපත් ගුණාංගයක් වන කීකරුකම පුංචි කාලයේ සිටම අප ජීවිත වල තිබිය යුතුය.**

අපේ අම්මලා, තාත්තලා මෙලොව අපට උරුම කර දීලා ලේ කිරි පොවලා ඔයාලාව ලොකු කළා නේද? ඔයාලාට උගන්වනවා. හිතන්න ඒ අම්මලා ඔයාලාට කොයිතරම් ආදරෙයිද? ඔයාලාව අසනීප වුනාම බලාගන්නවා. එයාලාට අවශ්‍ය දේ කැපකරලා පුංචි ඔයාලාගේ අවශ්‍යතා ඉටු කරනවා. හොඳ ඔවදන් දීලා ඔබලා යහපත් දරුවන් කරනවා. ඒ තරම් ආදරය කරන අපේ දෙමාපියන්ට අපි ගොඩක් ආදරය කරන්න ඕනේ නේද?




කියන දේ අහලා කීකරු වෙන්න ඕනේ නේද?.

දවසක් මම බස් එකේ යන කොට පොඩි මල්ලි කෙනෙක් එයාගේ අම්මා ගෙන් මොනවාදෝ ඉල්ලලා අඬ අඬා කරදර කරනවා. ඒ අම්මා ළඟ පොත් පත් සපත්තු වගේ ගොඩක් බඩු තිබුණා. මේ බඩු අරගෙන ඒ අම්මාගේ අතේ තිබුනු සල්ලිත් ඉවර ඇති. එදා ඒ අම්මා ගොඩක් අසරණ වෙලා හිටියේ...

ඒ නිසා අපිට යමක් තේරුම් ගන්න පුළුවන්නම් මේ විදියට දෙමාපියන්ගෙන් යම් යම් දේවල් ඉල්ලලා කරදර



කරන්නෙපා කවදාවත්. අපි අපේ දෙමාපියන්ගෙ අමාරුකම් තේරුම් ගන්න පුරුදු වෙන්න ඕනේ. කියන දේ අහන්න ඕනේ. එකට තමයි කීකරු කම කියන්නේ... හැමවෙලාවේම දෙමාපියන් වැඩිහිටියන් කියන දෙයට සවන්දීම ඔවුනට ගරු කිරීම හා කියන දේවල් අසා පිළිපැදීම ඔබ සතු යුතුකමකි.

ජේසුගේ පුංචි දරුවෝ වෙන ඔයාලා අද ඉඳන් හරි හොඳ යහපත් කීකරු දරුවන් වෙනවා නේද? එතකොට ජේසු තව තවත් ඔයාලාට ගොඩක් ආදරය කරාවි.

**සිතාරා ශෂිකා නැන්දා - හෝමාගම**
**( පන්නිපිටිය මිසම )**

## මාසික සිතිවිල්ල - ජයග්‍රාහී නිර්මාණය

මගේ පුංචි නංගියේ
මා අත ඇති මේ ලස්සන
පුංචි මල් වගේ
ඔයයි , මමයි හැමදාමත්
සුවඳ මල් වෙමින්
ගොඩක් ලොකු
මේ ලෝකය
කරමු සුවඳවත් ......



**තරුෂි ඊමායා මතුගම**
**07 ශ්‍රේණිය**
**සිරිකුරුස විදුහල - ගම්පහ**




**"මාර්තු මාසය"**
**ළමා ප්‍රදීපය,**
**අංක 02,**
**ඥානාර්ථ ප්‍රදීපය මාවත,**
**කොළඹ 08.**



**සේයා - ශ්‍රීයාංගනී පිලිෂියා**

# ළමා ලෝකය

**මල් සමනලුන් පස්සේ**
**හිනැහෙන බෝනික්කන් අතරේ,**
**ලෙවුණේ ඒ සොදුරු ළමා විය**
**හරි ඉක්මනට ගෙවිලා ගිහින්.....**
**පුංචි සන්ධියේ ඒ සිත් වල**
**තිබු චණ්ඩිකම් , මුරණ්ඩුකම්,**
**අමතක කර කෙලෙස ඉදිරියට යන්නද ?**
**පුංචි පුංචි සිහින දකිමින්**
**අහසෙ මාළිගාතනමින්**
**කෙළි කවට කම් පාමින්**
**ගත කළ පුංචි කාලයට**
**දැන් ඉඩක් නැත්තේ,**
**මේ රළු සමාජය නිසාවෙනි,**



**සකිලා ජයාංගනී**
**13 ශ්‍රේණිය**
**දංකොටුව බාලිකා මහ විදුහල**

# ජපමාලය



ලතින් භාෂාවෙන් Rosarium යන්නෙන් අදහස් කරනුයේ රෝස උද්‍යානයයි. එසේ නැතිනම් රෝස මල් මාලාවයි. ජපමාලය පාරම්පරික කතෝලික භක්ති අභ්‍යාසයකි. ජපමාල උච්චාරණයේ දී එකම යාච්ඤා පංතියක් පුන පුනා උච්චාරණය කරනු ලැබේ. ස්වාමිවාක් ආරාධනය, නමෝ මරිය, සාන්ත මරිය , පිතා පුත්‍රයා, ස්ප්‍රීතු ස්තෝත්‍රය, අහෝ මාගේ දෙවියනි, අභිරහස් මැයෙන් දැක්වෙන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයේ අවස්ථා භාවනාත්මකව සිහිපත් කිරීමයි.

සම්ප්‍රදායික ජපමාල අභිරහස් 15 ක් ඉතා දිගු කාලයක් පටන් පැවත එන අතර එය 16 වන සියවසේදී අති උත්තම පස්වන පියුස් ශුද්ධෝත්තම පියතුමන් විසින් හඳුන්වා දෙන ලදී. එම අභිරහස් පහලොව සොම්නස්, දොම්නස්, හා මොක්ෂ අභිරහස් ලෙස වෙන්කොට තිබූ අතර 2002 දී අති උතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා නව අභිරහස් පහක් හඳුන්වා දෙමින් එය ''ආලෝකයේ අභිරහස් '' ලෙස නම් තැබීය. ඒ අනුව වර්තමානය වන විට ජපමාලය සමඟ අභිරහස් 20 ක් ධ්‍යානයට ගැනේ. සොම්නස් සතියේ සඳුදා , සෙනසුරාදා හා ආගමන සමයේ ඉරුදිනවලද, දොම්නස් අභිරහස් සතියේ අඟහරුවාදා, සිකුරාදා හා චතාරික සමයේ ඉරුදිනවල ද, මොක්ෂ අභිරහස් බදාදා හා ඉරිදා දිනවලද, ආලෝකයේ අභිරහස් බ්‍රහස්පතින්දා දිනවල ද මෙනෙහි කිරීමට යොදා ගැනීම සසුන් පිය නියමයයි.

ජපමාලය මරිය මාතාවන් කෙරේ ගෞරවය දැක්වීමේ කතෝලික මගකි. මෙය ඒ ඒ යුගයන් හි සිටි ශුද්ධෝත්තම පියතුමන් විසින් ප්‍රවර්ධනය කරන ලද්දකි. අති උත්තම පස්වැනි පියුස් ශුද්ධෝත්තම පියතුමා ජපමාලය රෝමානු කතෝලික ජනවන්දනා දින දර්ශනයට හඳුන්වා දෙමින් සෑම වසරකම ඔක්තෝබර් 7 වැනිදා ජපමාලයේ අප ස්වාමිදූ මංගල්‍ය දිනය ලෙසද නම් කර ඇත. 2008 මැයි මස 3 වැනිදා අති උත්තම සොලොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ගැලවීමේ ඉතිහාසය පුරා ජපමාලය ඉතා වැදගත් භාවනාත්මක යැදුමක් ලෙස හඳුන්වා දී ඇත. මුල්ම යුගයේ ජපමාලයට ඇට 150 අඩංගු වූයේ බයිබලයේ ගෙතිලි ගී 150 අනුයමිනි. දොමිනිකාන නිකාය ඇතුළු විවිධ නිකායන් දවස පුරා ජපමාලය උච්චාරණය කරමින් බයිබලයේ පාඨ කියෙව්ව ද කියවීමට නොදත් ජනතාවට ඒ සඳහා අවකාශ නොවූහ. ජපමාලයේ මුල් ලොකු ඇටය ස්වර්ගයේ පියාණනි යැදුමට ද ඉන් පසු ඇති කුඩා ඇට තුන විශ්වාසය , බලාපොරොත්තුව හා දයාව වැඩිවීම සඳහා ද උච්චාරණය කෙරේ. ඉන්පසු ත්‍රිත්ව ස්තෝත්‍රය, අභිරහස් මෙනෙහි කිරීමද ලොකු ඇටය සඳහා ස්වර්ගයේ වැඩසිටින යාච්ඤාවද, පොඩි ඇට සඳහා නමෝ මරිය, සාන්ත මරිය යාච්ඤාව ද ලොකු ඇටය ත්‍රිත්ව ස්තෝත්‍රය , ප්‍රාර්ථනය ද ආදි වශයෙනි, සාතන් පළවා හැරීමේ සවිමත් ආයුධයක් ලෙස ජපමාලය හඳුන්වා දීමත් සමඟ ජපමාලය පැළඳීම කතෝලික ලෝකයේ සිරිතක් විය. මේ වන විට විවිධ මාදිලියේ ජපමාල නිෂ්පාදනය වන අතර ජපමාලය සඳහා ඉතා වැඩි ඉල්ලුමක් ඇත්තේ ආසියාවෙනි. එහි දී චීනය හා තායිවානය මුල් තැන ගනී. දුකට පත් වන කාරණය නම් ඊටවඩා කිතුනුවන් සිටින ශ්‍රී ලංකාව මේ අතර නොසිටීමයි . වසරකට නව ජපමාල මිලියන 70 ක් 100ක් ප්‍රමාණයක් නිෂ්පාදනය වේ. ඇමරිකාවේ පමණක් වසරකට මිලියන 7 ක් නිපදවා ලොව පුරා නොමිලේ බෙදා හැරේ. මරියාවන්ට කැපකර ඇති මෙම වසර තුළ දේව මෑණියන් පිළිබඳවත්, ජපමාලය පිළිබඳවත් පැහැදිලි අවබෝධයක් මෙයින් ලැබී ඇතැයි මම සිතමි.

**ඩිල්ෂාන් සම්පත් ප්‍රනාන්දු**
**13 ශ්‍රේණිය**
**සා. පියෝ කනිටු දේවසත්හල - කොච්චිකඩේ**




## කතෝලික දරුවන් දිරිගන්වන සැබෑ කතෝලික වැඩිහිටි පියෙක්

**ළමුන්ගේ කුසලතාවයන් අගය කිරීම, ඔවුන් දිරි ගැන්වීම ඔවුන් තුළ ආත්මාභිමානයක් ඇතිවීමට හේතුවන්නකි. මෙසේ ළමා ප්‍රදීපය තුළ පළවන ළමුන්ගේ නිර්මාණයන් දුටු (විශේෂයෙන් දුෂ්කර මිසම් වල) එම මිසම් සේවක පියතුමාගේද අවධානය යොමු කරමින් ළමුන්ව දිරි ගන්වන අයෙකු පිළිබඳව අපිට දැනගන්නට ලැබුණි. මෙම සමාජ සත්කාරය ගැන ගරු පියතුමන්ලා අපට දැන්වූහ.**

**ළමුන් හට තිළිණ වශයෙන් මුදල් ත්‍යාග ලබාදෙමින් "ළමා ප්‍රදීපය" පාඨකයකු වන තම දිවියේ සැඳෑ සමය ගත කරන මෙතුමන් නමින් අයිවන් රණසිංහ නම් වේ. මෙතුමා කුඩා දරුවනට දක්වන ආදරය, ඔවුන් දිරි ගැන්වීමට හා කතෝලික විශ්වාසය තුළ අඛණ්ඩව රැඳී එහි වර්ධනය තුළින් පිරිපුන් ශ්‍රී ලාංකිය කතෝලික සභාවක් ගොඩ නගන්නට දරන උත්සහය දෙවි මවුන්ගේ මැදහත්කම තුළ ස්වාමින් වහන්සේගේ ආශිර්වාදයෙන් දිරි ගන්වත්වා යන්න අපගේ ප්‍රාර්ථනාවයි. අයිවන් රණසිංහ මහත්මාණනි, ඔබ තුමන්ගේ කැපවීමට සැමගේ නොමද භක්ත්‍යාදරය.**

**කුමර නයනජිත්**

# 2014 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාව - ලෝකය තුළ පවතින දේව ක්‍රියාකාරීත්වය - පසුගිය ප්‍රශ්න එකතුව (2008 - 2012)

**1.3. ගිවිසුම් සංකල්පය**

37. උත්පත්ති පොතේ සඳහන් විස්තරයට අනුව දෙවියන් වහන්සේ සමග ගිවිසුමකට ඇතුළු වූ පාර්ශවයන් දෙකක් නම් කරන්න. (2012.01.2)

**1.4. ඊශ්‍රායෙල් ජනතාවට විමුක්තිය උදාකර දුන් මෝසෙස්**

38. පාරාවෝ රජුගේ වහලුන් බවට පත් වූ ඉශ්‍රායෙල් ජනතාව කළ කර්මාන්ත දෙකක් නම් කරන්න. (2012.01.3)

39. මෝසෙස්තුමා පාරාවෝ රජු හමුවෙහි අණ කළ විට සිදු වූ පළමු වන හා දෙවන වසංගත දෙක නම් ........ (2012.05)

40. රතු මුහුදින් එතරවීම සංකේතවත් කරනුයේ. (2008.02)

41. මිනිසාව කිසිම දිනක දෙවියන් වහන්සේ අසරණ නොකරන බව සනාථ කෙරෙන පැරණි ගිවිසුමේ කේන්ද්‍රගත සිද්ධිය නම් කරන්න. (2008.01.1)

42. ඉශ්‍රායෙල් ජනතාව දේව ජනතාවක් බවට පත්වූයේ,... (2011.04)

43. කෙටි සටහන් ලියන්න.''මෝසෙස්ගේ කැඳවීම හා කාර්ය භාරය''. (2009.07.3)

**1.5. පුරාණ ගිවිසුම තුළ දේව අනාවරණය**

**1.6. දිවැසිවර දූත මෙහෙවර**

44. දිවැසිවරුන්ට පැවරුණු ප්‍රධාන කාර්ය දෙකක් සඳහන් කරන්න. (2011.01.2)

45. ගැලවුම්කරුවාණන්ගේ පැමිණීමත් එතුමන් අප සමඟ ඇති කරන ගිවිසුමත් පිළිබඳ ප්‍රබල ඉඟියක් කළ දිවැසිප්‍රසාදිවරයා නම්.......... (2012.06)

46. කෙටි සටහන් ලියන්න. ''පෙරමග සරසන්නා වූ ස්නාවක ජුවාම්තුමා'' (2010.07.5)

47. ජේසුස් ස්වාමින් වහන්සේගේ දවසේදී මනස්ථාපනය වීම පිළිබඳ දැඩි අවශ්‍යතාවය ගැන ජනතාව අවදි කළ චරිතය වනුයේ,...... (2011.17)

**1.7. නව ගිවිසුමේ දේව පුත්‍රභාවය අනාවරණය**

48. දෙවියන් වහන්සේ පූර්ණ වශයෙන් අනාවරණය වන්නේ කා තුළින්ද? (මූලාකෘති ප්‍රශ්න පත්‍රය 2008.01.3)

49. දේව අනාවරණයේ අරමුණ වනුයේ ......... (2009.03)

50. ක්‍රිස්තුන් වහන්සේ මරණින් උත්ථාන වීම,...... (2011.10)

51. දෙවියන් වහන්සේ තම පුත්‍රයාණන්ගේ ''පුත්‍ර භාවය හෙළි කළ අවස්ථා දෙකක් ලියන්න. (2010.01.3)

52. ''මේ මාගේ පුත්‍රයාණෝ ය මේ මා තෝරාගත් තැනැත්තාණෝ ය. මොහුට සවන් දෙන්න.'' මේ ප්‍රකාශය හා සබැඳි සිද්ධිය වන්නේ. (2008.14)

53. කෙටි සටහන් ලියන්න. ''අන්‍යාරූප විලාශ වීමේ සිද්ධිය''. (2012.07.2)

**1.8. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දූත මෙහෙවර**

54. ගැලවීමේ ඉතිහාසයේ දී විවිධාකාරයෙන් අනාවරණය වූ පසු දෙවියන් වහන්සේගේ අවසාන හා පූර්ණ අනාවරණය සිදු වූයේ, (2012.08)

55. ''තුන්කාලේ ආරාධනාව'' යැදුම තුළින් අප සිහිපත් කරනුයේ ... (2008.05)

56. දේව පුත්‍රයාණන් මිනිස් බව ගෙන මෙලොවට වැඩම කර අප අතර වාසය කිරීම හඳුන්වනුයේ, (2011.09)

57. මිනිසා නිගා කරගත් උතුම් මනුෂ්‍යත්වය තව දුරටත් ආරක්ෂා වූයේ, (2011.26)

58. වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව නම් විශ්ව ප්‍රකාශනයේ අංක 22 හි සඳහන් ආකාරයට මනුෂ්‍යයාගේ අභිරහස එළිදරව් වන්නේ .......... තුළ ය. (2012.15)

59. ''උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යැයි කියනු ලබන සේක. මෙහි උන්වහන්සේ යනුවෙන් කවුරුන් පිළිබඳ ඉඟි කරනුයේ ද? (2012.07)

60. ජේසුස් වහන්සේ ඉගැන්වූ මෙම ඉගැන්වීම සම්පූර්ණ කරන්න. ''මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් ..................... (2008.01.9)


ඉතිරිය ලබන සතියේ .....

ගරු ඩේමියන් පෙරේරා පියතුමා






දළුපත ශා. අන්තෝනි සිද්ධස්ථානයට අයත් පල්ලන්චේන දහම් පාසලේ සිසු නායක නායිකාවන් හට පදක්කම් පැළඳීම පසුගියදා සිදු කෙරිනි. පදක්කම් පැළඳි ළමුන් මීසම් සේවක ගරු දිනේෂ් ප්‍රනාන්දු, සහයක ගරු නුවන් බුද්ධික පියතුමන්ලා, තේවාචාරි ගරු ටෙෂන් ප්‍රියදර්ශන සහෝදරතුමා දහම් ගුරු භවතුන් සමඟ ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. දළුපත, පල්ලන්චේන හා නෙළුම්පිටිය යන දේවස්ථාන වල දහම් පාසල් වල ශිෂ්‍ය නායක ළමුන් සඳහා මෙදින පදක්කම් පැළඳවීම විශේෂත්වයකි. **ප්‍රගීත් ශිරෝමන්**



**කොළඹ ශාන්ත බෙනඩික් විදුහලේ 2014 වර්ෂය සඳහා නව ශිෂ්‍ය නායක මඬුල්ලේ දිවුරුම් දීමේ උත්සවය පසුගියදා සිදුකෙරිනි. ගරු ප්‍රවීන් වාස් සහෝදරතුමා (ප්‍රධාන අනුශාසක) ගරු ජානක ෆොන්සේකා සහෝදරතුමා (විදුහල්පති) ප්‍රදීප් මොරායස් (ප්‍රධාන ආරාධිත අමුත්තා) යන අය සමඟ පදක්කම් පැළඳි සිසු නායකයින් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. අශේන් එස්. සේනාරත්න**

## නොනිමි සෙනෙහස ඔබයි මව්නි

සිරුරේ දිවයන රුහිරුන් කිරි වූ
ඔබේ ආදරෙන් , දසමසක වේදනාවත්
මෙතුවකුත් මගේ දුකත් ඔබ දැරූ නිසයි
මාගේ අම්මේ, හදවතින් පෙම් කළේ..........



දිලෙන මිණි කැටයකට
බබළන්න ලොව පුරා
රජවන්න කිරුළු දරා
පාර කිව්වේ ඔබමයි අම්මේ


අනුරාධා නිමාෂි

උපුටා ගැනිම
**"පිණි පොදක කවි සේයා"**
**ග්‍රන්ථයෙනි**




# රැකගනු මැන අප මුනිඳුනි

කුසුම් ලතාවෙන් සදා පිදෙන ඔබයි මුනිදේ
දුබල සසුනිහයන්ට මඟ
සැදුවේ ඔබයි මුනිදේ
රෝ දුක් වසංගත සුව
කර දුන්නේ ඔබයි මුනිදේ
තම සතු සැමදෙය
දහමට කැපකළේ ඔබයි
මුනිදේ



මුව මඬල සෝබමාන වූ
විරුවාණනේ
එඩිතර සුරවිර සෙම්පතියාණනේ
ඊ පාරින් වද වින්දාවූ
සුරවිරුවාණනේ
රැක ගනු මැන අප නිති ප්‍රිය
මුනිඳුණනේ

**සුමුදු දිව්‍යාංගනා**
09 ශ්‍රේණිය
සා. මරියා දහම් පාසල - හපුගොඩ

# මිතුදම

සොඳුරු වූ සොම් සඳ පෑ
අඳුරු අහසට
දිලිහෙන තරු වැල් පොකුර
තනුවැල් පබඳින්නේ ජීවන ගීතයට
මහා සයුර වුවද
විටෙක නිසසල වන්නීය
සයුර ගයන ගීතය
එකම තනුවකි හදවතේ
රිද්මයට
රිදවන රිදුම් තුළ
කඳුළු කැට
නොවැටෙන්නට
කවා සිනා හසරැල් දෙතොලට
නිබඳ දෙන්නේ හදවතේ සැනසුම
අරුම වූ ලොව තුළ
නොවෙනස් දේ වෙනස්වන විට
පතන දේ නොලැබෙන විට
නොසිතූ දේ සිදු වන විට
ලබැඳියන් හැර යන විට
සදා සැනසුම මිතුදම නම් විය......

**අශානි නවින්ද්‍යා තමෙල්**
10 ශ්‍රේණිය
සින්දත්‍රි මාතා දහම් පාසල
වයික්කාල මීසම



වැස්ස වැස්ස වැස්ස ව
හෝ හෝ ගා මහා පො
පුංචි ළමයි ඔරු සාදා වි
ටොං ටොං ගා මහ පො

**නිර**
(
සිරිකුරු

**"සොබාදහම දෙවිඳුන් අපට දුන් විචිත්‍රවත් ප්‍රේමයේ හසුන් පතකි" යන කියමන මහා කවි රවීන්ද්‍රනාත් තාගෝර් තුමා විසින් කියන ලද විශිෂ්ට කියමනකි.**

# මැවිල්ල තුළින් දේවි

දෙවියන් වහන්සේ මේ ලෝකය අප සැමට මවාලුයේ උන්වහන්සේ තුළ අපට ඇති ප්‍රේමය නිසාවෙනි. එමෙන්ම රෝම 1:20 වගන්තිය තුළ උන්වහන්සේගේ සදාතන බල මහිමයත් දේවත්වයත් ඔවුන් වහන්සේගේ මනසට පෙනීයන පරිදි ඔවුන් වහන්සේගේ මැවිලි වලින් ප්‍රකාශ කරන බව සහතික කර ඇත. දෙවියන් වහන්සේ ලෝකය මැවීමේදී පලමුව ඉර, හඳ, තරු, ගස්වැල්, සතුන් වැනි මනුෂයාට අවශ්‍ය සියලු දේ මවා පසුව මනුෂ්‍යයාව මවනු ලැබුවේය. අනෙකුත් මැවිලිවලට වඩා මනුෂ්‍යයාට මුල්තැන දෙමින් උන්වහන්සේගේ මහත් බලය තුළින් මිනිසාට බුද්ධියක් ලබා දුන්නේය. ඒ අනුව මැවිල්ලේ මැවුම්කාරයාණන් වන්නේ මහිමවත් දෙවිපියාය. ඔබ මා එහි භාර කරුය.

වියළි පොළොව වැසි බිඳක් පතා අහසට මුව අයා සිටියි. අහස පොලවට වැසි දෙයි. පොළොව මහත් සොම්නසකින් එය ලබා ගනී. පොළොව නැවත එය අහසට දානය කරයි. වාෂ්පිකරණය යනු එයයි. අහස එය භාරගනී. නැවත වලාකුළු සෑදේ මෙම පියවර හතරද මැවිල්ල තුළ සිදුවන ප්‍රේමයේ ක්‍රියාවලියකි. දෙවියන් වහන්සේ තම ප්‍රේමයේ බලය තුළින් මෙවැනි ක්‍රියා රාශියක් මවා ඇත.

එමෙන්ම තම මැවිලි අ
වන මනුෂ්‍යයාගේ ඇති
මනුෂ්‍යයා තුළ ඇති ආ
වේ. මේ නිසා ඔබ මට 
අපගේ මැවුම්කාරයාණ
හඳුනා ගැනීමට පිපාසය
වේ.

නව නිපැයුම් තුළින් ප්‍ර
පිළිබඳ කථා කළහොත්
දෙවිඳුන් දුන් බුද්ධියෙන්
සොයාගැනීම් සමුදායක්
ආශ්චර්යමත් මැවීමක් 
ආරම්භයේදීම මේ විශ්



## මිත්‍රත්වය

ජීවිතය දිගු වන්දනා ගමනේදී
සෙනෙහසින් හමු වූ ඔබ
මා වෙත පිදූ උත්තරීතර වූ
මිත්‍රත්වය අගයමි

**ශාලනි හසන්ති හංසිකා**
10 ශ්‍රේණිය
ශු. පවුලේ දහම් පාසල - බිබිල



## සුන්දර ශ්‍රී ලංකා

කෝමල දිය ඇලි ගංගා ගලා බසින්නේ
රට වට මහා සයුරයි රට මැද කඳුකරයි තිබෙන්නේ
හැටහය වසරක නිදහස ඔබ සමරන්නේ
ලංකා මෑණියේ ඔබ සැම දින වැජඹෙන්නේ

රත්නදීප ලෙසිනුයි ඔබ අමතන්නේ
මිනි කැට පොළොවෙන් මුතු කැට සයුරෙන් ඔබ සරසන්නේ
ධීර වීර පුතුන්ගේ නිජ බිම ලෙසිනේ
වැජඹෙනු මැන සැමදා ඔබ තුටිනේ

**හිරුණි රංසිකා**
10 ශ්‍රේණිය
ශා. ඉසිදෝරු දහම් පාසල - තිබ්බොටුගොඩ

## වැස්ස

වැස්ස වහිනවා
ළවට වතුර ගලනවා
තුරේ යවනවා
ළවට වතුර වැටෙනවා

**නි නවෝදනී**
07 ශ්‍රේණිය
ෂ දහම් පාසල - තරාල



# ම මහිමය අත්දකිමු

තර උතුම්ම මැවිල්ල
විශේෂත්වය වන්නේ
ත්මය හෙවත් ස්ප්‍රීතුව
අප සියලු දෙනාටම
ත් වන දෙව්පියාව
ක් නිරතුරුවම ඇති

කාශ වන දේව මහිමය
විද්‍යාව වනාහි
සිදු කළ මිනිස්
විනා එය මිනිසාගේ
නොවේ. එසේ නම් එය
ය තුළ ජනිතව තිබිණි.

දේව සමානත්වය ලද මනුෂ්‍යයාට බුද්ධියක් නිර්මාණාත්මක හැකියාවක්ද සුවිශේෂ දක්ෂතාවයක්ද උරුමව ඇත. දෙවියන් වහන්සේ ලෝකය තුළ ස්ථාපිත කර ඇති විවිධ බල ශක්තීන් සොයාගෙන විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රගතියක් ලබා ඇත. ඒ මගින් මනුෂ්‍යයා දේව මහිමය වඩ වඩාත් අත්දැකිය යුතුය. ඒ වගේම ඇල්බර්ට් අයින්ස්ටයින් විද්‍යාඥයා ප්‍රකාශ කරන අන්දමට ''සෑම විද්‍යාත්මක පදනමක ම මූලික අරමුණ විය යුත්තේ මිනිසාට යහපත සැලසීමයි''.
නමුත් දෙවියන් වහන්සේ දුන් බුද්ධිය තුළින් නව සොයාගැනීම් නව නිපැයුම් වලට යොමු වූ මිනිසා ඉතාම සුවිශේෂ මිනිසුන් වේ. නමුත් අතීතය තුළ නිර්මාණය කරන ලද තාක්ෂණය වර්තමාන සමාජය අනිසි ලෙස භාවිත කරයි. උදාහරණ වශයෙන් ජංගම දුරකථනය, මුහුණු පොත, අන්තර්ජාලය, රූපවාහිනිය වැනි දෑය. නමුත් ඒ ශ්‍රේෂ්ඨ මිනිසුන් එවන් දෑ සොයා ගනු ලැබුවේ යහපත් ලෙස පරිහරණය කර තම එදිනෙදා කටයුතු පහසු කර ගැනීම සඳහාය. එසේ නම් දෙවියන් වහන්සේගේ බල මහිමය මැවිල්ල තුළින් අත්දකිමින් නූතන තාක්ෂණය යහපත් ලෙස යොදා ගනිමින් අධ්‍යාත්මික ජීවිතය තුළින් අපට සියලු දේ ජය ගත හැකි බව අවබෝධ කර ගනිමින් ජීවත් වන්නට ආරාධනා කරමි.

**සුදම්මි කාදේෂි කුරේ**
**උතුරු පයාගල**

# අපේ කාලයේ දහම් ගැටලු

## Question and Answers

**I receive message from friends on Face book or via E - mail telling me to make a wish, say a parti cular prayer for five days, then pass on the message to 10 people. Should I just trash them or send a sharp reply?**

Priests still find such chain prayers at the back of churches, sometimes, with the instruction to make ten photo copies. These days we dutifully put them in the recycle bin. **The Catechism says**; "To attribute to efficacy of prayers or sacramental signs to their mere external performance, apart from the interior dispositions that they demand, is to fall into superstition" **(211)** The instructions to 'make a wish trivializes the concept of making a genuinely devotional intention for our prayers and the condition of passing the message on is a distortion of the idea of encouraging others to pray. When they appear on the internet such travesties give a bad impression to those who may already have doubts about the Christian faith.

People who pass on chain prayers may have a limited understanding of the faith and naively intend to do something good. Gentle correction would be a work of charity, but if an argument develops over you 'brea king the chain' I would counsel choosing the option to 'leave the conversation; your initial comment will stand. of you do not have the time to reply, simply sending the message to a trash can is a reasonable response.

There are devotions and sacramentals which are approved by the Church. we should also understand that the value of these does not lie simply in their external performance, but that they depend for their efficacy on the devotion of the participant and the prayers of the Church.

## ප්‍රශ්න හා පිළිතුරු

**මුහුණු පොත හෝ ඊ මේල් ඔස්සේ මිතුරන්ගෙන් ලද පණිවුඩයකින් කියවුණේ කිසියම් ප්‍රාර්ථනාවක් සිත්හි තබාගෙන එවා ඇති යාච්ඤාව නොකඩවා දින පහක් උච්චාරණය කරන ලෙසත්, ඉන්පසු පුද්ගලයන් දස දෙනෙකු වෙත යවන ලෙසත්ය. මා මෙය ඉවත් කරන්නද? නැතිනම් අකුරට ඉටු කරන්නද?**

මෙවැනි දම්වැල් යාච්ඤා දෙව්මැදුරුවල තබා ගොස් ඇති විට පියතුමන්ට ද ලැබී ඇති අතර සමහර විට ඒවායේ උපදෙස් දී ඇත්තේ පිටපත් 10 ක් යවන ලෙසටය. බොහෝ විට අපි ඒවා කුණු කූඩයට දමන්නෙමු. කතෝලික ධර්මෝපදේශය පවසන්නේ යාච්ඤාවන්ගේ හෝ සක්‍රමේන්තු සලකුණු ඵලදායි වීමටත්, බාහිර අගය වැඩිවීමටත් හේතු කරගන්නවා මිස අභ්‍යන්තර කැළඹීමකට හෝ මිථ්‍යා දෘෂ්ටිකත්වයට ඇද වැටීමට හේතු නොවිය යුතුයි.

මේ උපදෙස් මගින් ප්‍රාර්ථනාවක් කිරීමේ සංකල්පය වඩාත් භක්තියෙන් වැදගත් අවස්ථාවක කරන දේවල් පවා සුළු කොට තැකීම සෙසු අය යැදුමට දිරි ගැන්වීමට හානිකර විය හැකිය. මේවා අන්තර්ජාලය තුළින් ප්‍රකාශ වීම මගින් කිතුනු විශ්වාසය පිළිබඳ යම් යම් ගැටලු ඇති අය තුළ වඩාත් වැරදි ආකල්ප ඇතිවීමට හේතුවේ.

දම්වැල් යාච්ඤා හුවමාරු කරගන්නා අය තුළ විශ්වාසය පිළිබඳ සීමාසහිත අවබෝධයක් ඇති බව ප්‍රකට වන අතර ඒ ඔස්සෙ ඔවුන් යම් යහපත් දෙයක් කිරීමේ වෑයමක නිරතවේ.

මේ පිළිබඳ වාද විවාදයන්ට යොමු වනවාට වඩා ඔබගේ ප්‍රථම කටයුත්ත විය යුතුව ඇත්තේ ඒවාට පිළිතුරු සැපයීමවත්, එසේ කිරීමට නොහැකිවීම ගැන කරුණු දැක්වීමවත් නොව එම පණිවුඩය මකා දැමීමය. කතෝලික සභාව අනුමත කළ භක්ති අභ්‍යාස හා චාරිත්‍රයන් පවතින අතර අප තේරුම් ගතයුතු වන්නේ බාහිර ආටෝපයන් ට නොරැවටී සභාවේ යැදුම් නිසි භක්තියකින් හා ගෞරවයකින් ඉටු කළ යුතුව ඇති බවයි.


**ජේම්ස් සංජීව ජයසිංහ**

# ක්‍රිස්තියානි ඉතිහාසයේ අසිරිය 46

## නූතන ලෝකය තුළ ක්‍රිස්තියානිය

### නූතන චින්තනවාදය

10 වෙනි පියුස් පාප්තුමාට වැලැක්වීමට අවශ්‍ය වූයේ වගකීමකින් තොරව කෙරුණ එවැනි නිගමනයන් ය. පතුරුවා හරිනු ලැබූ එවැනි අන්තවාදී අදහස් ය. ''නූතන චින්තනවාදය සේ එතුමා දැක්වූයේ ඒ විනාශකාරී ව්‍යාපාරය ය. අත්හළ යුතුයැයි එතුමා සැලකූ නිගමන දැක්වීමට ලේඛකයින් කිහිප දෙනෙකුගේ අදහස් එතුමා උපුටා දැක්වීය. එහෙත් එතුමා එසේ කළේ කාගේවත් නම් ගම් සඳහන් නොකර ය. ඒවායින් කිහිපයක් මෙසේ ය.



සත්‍යය මිනිසාට සම්බන්ධය. මිනිසා දවසින් දවස පරිනාමය වන්නා සේ සත්‍යයද පරිනාමය වේ.

හැම යුගයකම වසන හැම කෙනෙකුටම ඒකාකාරව බලපාන ධර්මතා මාලාවක් ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වූවේ නැත. එතුමා ආරම්භ කළ ධර්ම ව්‍යාපාරය කාලයෙන් කාලයට ස්ථානයෙන් ස්ථානයට ද හැඩගසා ගත යුත්තකි.

ධර්ම සිද්ධාන්තවලට වහල්වී සිටියහොත් ක්‍රිස්තියානියට කවදාවත් විද්‍යානුකූල වීමට ලැබෙන්නේ නැත. කතෝලික සභාව රෙපරමාදු සභාව ආදර්ශයට ගෙන නිදහස් චින්තනයට ගරු කළ යුතුය.

එවැනි අදහස් වල දෝෂ සහිත භාවය දක්වමින් එවැනි චින්තාවලියකට නැඹුරු නොවන මෙන් එතුමා කතෝලිකයින්ගෙන් ඉල්ලා සිටියේය. හැම පූජකවරයෙක්ම ''නූතන චින්තනවාදය'' ප්‍රතික්ෂේප කළ යුතුයැයි කියාද, ඒ ප්‍රතික්ෂේපය ප්‍රතිඥාවක් තුළින් ප්‍රකාශ කළ යුතුයැයි කියාද නියෝග කළේය. පියුස් පාප්තුමා 1914 දී අපවත් වන විට නූතන චින්තන වාදය කතෝලික සභාවෙන් මුළුමනින්ම මෙන් බැහැර වී තිබුණායැයි කිව හැක.

10 වෙනි පියුස් පාප්තුමා විසින් සභාවේ සංශෝධනයට ද, සංවර්ධනයටද, විශේෂයෙන් සාමාන්‍ය බැතිමතුන්ගේ යහපතටද, කරන ලද සේවය නිසා කතෝලිකයින් අතර එතුමන් වෙත විශේෂ ගෞරවයක් හා භක්තියක් ඇති විය. එතුමාගේ මරණින් පසු බැතිමතුන්ගේ උද්ඝෝෂණය මතට එතුමා ''සාන්තුවර'' තනතුරටද ඔසවනු ලැබුණේය. පසුගිය ශත වර්ෂ හතර තුළ ''සාන්තුවර'' සම්මානය හිමි කරගත් එකම පාප්තුමා එතුමා වේ.

පාප්තුමා විසින් ඉතාමත් ප්‍රශංසනීය ලෙස ගනු ලැබූ මෙම කාලෝචිත පියවර වරදවා තේරුම් අරගෙන වැරදි ලෙස ක්‍රියාත්මක කළ පිරිසක් එතුමන්ගේ මරණින් පසු බිහිවන්නට විය. මොවුහු කුමන ක්‍රමයක හෝ නූතනකරණයකට සහමුලින්ම විරුද්ධ වූහ. එම ව්‍යාපාරය රෝමයේ සිටම ක්‍රියාත්මක වන්නට විය. අලුතින් සිතන මතන හැම කෙනෙක්ම ධර්ම විරෝධීන් හා මිත්‍යා දෘෂ්ඨිකයින් සේ හඳුන්වමින් ඔවුන්ට තර්ජන එල්ල කළහ.

බොරු නම්වලින් ඔවුන්ට විරුද්ධව පත්‍රවල ලිපි ලියූහ. චරිත ඝාතන කරන ලියුම් එකිනෙකා වෙත නිර්නාමිකව තැපැල්කර යැවූහ. මෙම ව්‍යාපාරයේ බොහෝ කටයුතු සිදුවූයේ පාප්තුමන්ගේ පවා අනුදැනුම නැතුවය. මෙම ව්‍යාපාරයේ කටයුතු මැඩ පැවැත් වීමට 15 වන බෙනඩික් (1914 - 1922) පාප්තුමන් විසින් දරණ ලද ප්‍රයත්නයද එතරම් සාර්ථක නොවීය. මෙම අමානුෂික ව්‍යාපාරය නිසා පීඩාවට හා චිත්ත වේදනාවට පත් ශ්‍රේෂ්ඨ ක්‍රිස්තියානි චින්තකයින්ගේ සංඛ්‍යාව සුළු පටු නොවේ. එහි හොඳම නිදසුනක් වනුයේ තෙයියාඩ් ඩේ ෂාර්ඩෑන් පියතුමාය

**ඉදිරියට .......**

**සංස්කාරක පියතුමන් විසිනි**

# දෙවිඳුන් මැවූ ලොවෙහි අසිරිය



**ඔකිත හේෂාන්**
03 ශ්‍රේණිය
ශු. බෲනෝ මුනිඳු දහම් පාසල
තඹකන්ද



**ෂෙනුලි ඈන් මාෂිනි**
02 ශ්‍රේණිය
ශා. ජෝසප් දහම් පාසල
පමුණුගම

**පුංචි අපේ චිත්‍ර පිටුව**

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න. "පුංචි අපේ චිත්‍ර පිටුව" ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**උතුම් නවංජන**
04 ශ්‍රේණිය
ශු. මතෙව් ධර්මදූත ළමා සමාජය
ඒකල (කොටුගොඩ මීසම)



**මතීෂා එත්මි**
02 ශ්‍රේණිය
සා. මරියා දහම් පාසල
මාරවිල






**චමිෂා අමන්දි සිල්වා**
01 ශ්‍රේණිය
ශා. රෝකුස් මුනිඳුන්ගේ දහම් පාසල - ඇලතුර



**කයිලි මෙලිසා**
04 ශ්‍රේණිය
වික්ෂෝප දේවමාතා දහම් පාසල
පල්ලන්සේන




# ශු. හෙලේනා මුනිතුමිය

බ්‍රිතාන්‍යයේ ඉපදුන හෙලේනා, රෝම අධිරාජ්‍යයේ හේවායෙක් වන කොන්ස්තන්තිනු ක්ලෝරන්ස් සමග විවාහ වුවාය. පසුව කොන්ස්තන්තිනු බටහිර යුරෝපයේ අධිරාජයා විය.



දේශපාලන හේතූන් මත ඔහු හෙලේනාව දික් කසාද කළේය. නමුත් ඇගේ එකම පුතා වන තරුණ කොන්ස්තන්තිනු සිය මවට ඉතා පක්ෂ පාතව සිටියේය. ඔහු ක්‍රි.ව. 312 දී අධිරාජයා වූ විට ඔහුගේ මවට අසාමාන්‍ය ගෞරවයක් ලබා දෙන ලදී. කොන්ස්තන්තීනුගේ විශේෂ ජයග්‍රහණයට පසුව හෙලේනා කිතුනු ආගම වැළඳ ගත්තාය. ඉතා විශ්වාසවන්ත බැතිමත් ක්‍රිස්තියානිකාරියක වශයෙන් මහත් ආදර්ශමත් වූවාය. ඇගේ ත්‍යාගශීලී බවත් , අධිරාජිනිය වශයෙන් ඉමහත් බලය සත්‍ය විශ්වාසය පැතිර වීමට මහත් හේතුවක් විය.


යුරෝපයේ බොහෝ දේවස්ථාන පිහිටුවූ පසු ඇය 75 වන වියේදී වන්දි ගෙවීමේ ගමනක් වශයෙන් ශු. දේශය වෙත ගියාය. මෙහිදී ඇය ජේසුස් වහන්සේ ඉපදුන ගුහාව ළඟ දේවස්ථානයක් ගොඩනැගුවාය. තවත් දේවස්ථානයක් අනෙක් පස කන්ද උඩ පිහිටුවන ලදී. හෙලේනා තුමී ඇයට වසර 80 ක් වූ විට , ජෙරුසලම කරා ගියාය. ඇගේ එකම බලාපොරොත්තුව වූයේ අප ස්වාමින් වහන්සේ මරණයට පත්කළ ශු. කුරුසිය සොයා ගැනීමය. ඇය කල්වාරි කන්දේ කැනීම් කරවන ලදී. එවිට ඇයට කුරුස තුනක් හමු විය. ජේසුස් වහන්සේගේ කුරුසිය කුමක්දැයි ඇය නොදත්තීය. එක්තරා අසාධ්‍ය රෝගී කාන්තාවක් ශු. කුරුසිය ස්පර්ශ කළ සැනින්ම සම්පූර්ණ සුවය ලැබුවාය.

මේ සිද්ධියෙන් පසු ශු. කුරුසිය තුනකට බෙදා එක් කොටසක් ජෙරුසලෙමේ ද, තවත් කොටසක් කොන්ස්තන්තිනෝපලයේද, ඉතිරි කොටස රෝමයේද තැන්පත් කරන ලදී. රෝමයේ ශු. කුරුසියේ බැසිලිකාව තුළ අදත් මෙහි කොටස් දක්නට ඇත.

ඉතා සුළු කොටසක් හෙලේනා තුමිය විසින් ඉතා ගෞරවයෙන් තබා ගත්තාය. පසු කලෙකදී ඇගේ පුත්‍රයා සතුරන් සමග යුද්ධ කරමින් සිටින විට ඔහුට තම මව විසින් ගෞරව කරනු ලබන ශු. කුරුසිය යහපත් වූ භාරයක් විය. එනම් මෙම යුද්ධයෙන් ජයග්‍රහණය කළ හැකි වුවොත් , ඔහු කිතුනු ආගම වැළඳ ගන්නා බවය.

කොන්ස්තන්තිනු හට යුද්ධයේ ජය අත්විය ඉන්පසු භාරය ඉටුකළා පමණක් නොව, ලොව පුරා කුරුසිය ජයග්‍රහණයේ ලකුණක් ලෙස සැලකීමටද අණ කර සිටියේය. මෙම ශු. කුරුසියේ ඉතා සුළු කොටසක් සෑම අල්තාර ගලකම තැන්පත් කර ඇත. හෙලේනා තුමියගේ යාච්ඤාව හා දැහැමි ජීවිතයත් මගින් තම පුත්‍රයා දෙවි පියාණන් වහන්සේට දිනා දුන්නාය. මෙලෙස හෙලේනා තුමිය නිදහස් යුගය තුළ විසූ ප්‍රබල ක්‍රිස්තු වීරවරියකි. ඇගේ මංගල්‍යය අගෝස්තු මස 18 වන දින දී පවත්වනු ලැබේ.

අසේල දසනායක



## ප්‍රහේළිකා අංක 43

### හරහට

1. ක්‍රිස්තුන් වහන්සේගේ ගෝලයන් මෙය නොකරන්නේ මන්දැයි ස්නාවක ජුවාම් තුමාගේ ගෝලයෝ ක්‍රිස්තුන් වහන්සේගෙන් ප්‍රශ්න කළෝය.

4. ''..................... කරන්න, ඔබට දොර අරිනු ලැබේ''. ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

5. ''............. සත්‍යයද, ජීවනයද, මම වෙමි'' ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

7. ක්‍රිස්තුන් වහන්සේ වදාළේ මේවායින් ගස හඳුනාගත හැකි බවයි.

8. නීති විරෝධිවූ ඌරුමස් අනුභව නොකිරීම නිසා මවක් හා දරුවන් සත් දෙනෙකු මර ණයට පත් වූ අයුරු ශුද්ධවූ බයිබලයේ මෙම පොතේ විස්තර වේ.

10. දෙවියන් වහන්සේ තම ස්වරූපය අනුව මිනිසා මවා වදාළ සේක. මෙය..... වන දවසය. මෙහි හිස්තැනට සුදුසු වචනය

### පහළට

1. අසා සිටි සැම දෙනාටම තේරුම් ගත හැකි ලෙස තම ඉගැන්වීම් ඇතැම් විට මේවා මාර්ගයෙන් ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වූ සේක.

2. ''ඔබේ විරුද්ධ කාරයා සමග උසාවියට යන කල මඟදීම ඉක්මනින් ඔහු හා සමගි වන්න. නැත්තම් ඔබ නඩු කාරයාට බාර දෙන්නේය අන්තිම ...... ට දඬය ගෙවනතෙක් ඔබ කිසිසේත් පිටවී නොයන්නේය'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. මෙම දොරටුවෙන් ඇතුල්වන්න වීර්යය කරන්නැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

6. දෙවියන් වහන්සේට මෙය දක්වන්නන්ගේ ජීවිතය පිළිබඳව උපදේශකයා , හෙවත් සිරාක් විස්තර කරයි.

7. ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගැසීමට පෙර හේවායෝ මෙම වදන් වලින් උන්වහන්සේට නිගා කළ බව කියැවේ.

9. ක්‍රිස්තුන් වහන්සේව මරණයට පත් කිරීමට පෙර උන් වහන්සේට මේවායින් තැලූ බව කියැවේ.

**(මෙම ප්‍රහේළිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. මාක් 5,7,9 ශු. ලූක් 6, උපදේ ශකයා හෙවත් සිරාක් 32/14, උත්පත්ති 1 )**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

## මා පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාව වූ දිනය



කොටහේන යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය නායිකා නිල ලාංජන පැළඳ වීමේ උත්සවයේදී, ගුරු විදුහල්පති මව්තුමිය මා හට ප්‍රධාන නායිකාව ලෙස ලාංජන පැළඳවූ සුන්දර මොහොතේ මගේ නෙත් සතුටු කඳුලින් තෙත් වුයේ නිතැතින්මය.

කුඩා අවධියේ සිට පාසල් කටයුතු වලට ඔවදන් දුන් සෙනෙහෙබර මව්පියන් සේම, පළමු ශ්‍රේණියේ සිට මේ දක්වා අකුරු කරවූ ගුරු මෑණිවරුන්ද, මේ අවස්ථාවේ ගෞරවයෙන් මතකයට නැගුණේ මේ සැමදෙනම කුඩා කාලයේ සිට මා හට දුන් ඔවදන් මල් ඵල ගැන්වූ අවස්ථාවක් ලෙසය.

මා ලැබූ ප්‍රධාන ශිෂ්‍ය නායිකා තනතුර නිහතමානිව භාර ගත් අතර ගුරු විදුහල්පති මව්තුමියට හා ගුරු මණ්ඩලයටද, පාසලේ සැම කටයුත්තකදීම ප්‍රධාන ශිෂ්‍ය නායිකාවක ලෙස ඉටුකළ යුතු සැම යුතුකමක්ම ඉතාමත් වගකීමෙන් යුතුව ඉටු කිරීමට මම අදිටන් කර ගතිමි.

**සනුල්යා පීරිස්** - 05 ශ්‍රේණිය
**යහපත් එඬේරාගේ කන්‍යාරාමය - කොටහේන**


ශුද්ධවූ බයිබලය ඇසුරෙනි
මෝසෙස්
43
චිත්‍ර කතා රචනය ආනන්ද කල්දේරා
දෙබස් හා චිත්‍ර පාලිත සඳුආරච්චි
හරි... පාරාවෝ අපට අපේ මිනිස්සු හා සතුන් සමග ඊජිප්තුවෙන් පිට වෙන්න අවසර දුන්නා.. අපි මේ බව ඔවුනට දන්වමු...
හේයි.. ඊශ්‍රායෙලි ජාතික මාගේ සහෝදර වරුනි.. පාරාවෝ අපට ඊජිප්තුව හැර යන්න අවසර දුන්නා.. දැන් නුඹලා නිදහස් මිනිස්සු.. අපි ඊජිප්තුවෙන් පිටවෙමු.....: වහාම....
අහා.. අපි නිදහස් අපි නිදහස් දෙවියන් වහන්සේට ආශිර්වාද වේවා..
දැන් ඉතින් අපි නිදහස් තව දුරටත් අපි පාරාවෝගේ වහලුන් වන්නේ නැහැ..
මෙය ඊජිප්තු ජාතිකයිනට කිසිදා අමතක නොවන රාත්‍රියක් විය
දෙවියන් වහන්සේ අපට නිදහසත් වස්තුවත් ලබාදී තිබෙනවා..
ඔව්.. ඔව්.. අපව වහල් බවෙන් මුදාගෙන අපට මේ සැම දේම ලබා දුන් දෙවියන් වහන්සේට.. අප සදා ණය ගැතියි...


අහා.. අපි නිදහස් අපි නිදහස් දෙවියන් වහන්සේට ආශිර්වාද වේවා..
දැන් ඉතින් අපි නිදහස් තව දුරටත් අපි පාරාවෝගේ වහලුන් වන්නේ නැහැ..
මෙය ඊජිප්තු ජාතිකයිනට කිසිදා අමතක නොවන රාත්‍රියක් විය
දෙවියන් වහන්සේ අපට නිදහසත් වස්තුවත් ලබාදී තිබෙනවා..
ඔව්.. ඔව්.. අපව වහල් බවෙන් මුදාගෙන අපට මේ සැම දේම ලබා දුන් දෙවියන් වහන්සේට.. අප සදා ණය ගැතියි...

# JOSEPH VAZ

ළමා ප්‍රදීපය

**Part -02**

Joseph Vaz was a man who heard the sad plight of Sri Lankan Catholics and was moved so much to help them that while engaged in pastoral work in Kanara, he even thought of having himself sold as a slave to Dutch traders from Sri Lanka in the hope of getting into the island that way.



Joseph grew up in the love of God. He began to reach out to the backward children and poor of the village. His mother used to refer to him affectionately as "my little saint".



He spent much time praying at night while his family thought he was asleep. It is said that he would escape to the parish church early in the morning and its doors would automatically open wide to welcome him.



Noticing these special signs, his father helped him pursue a priestly vocation. He took him to the Jesuit College of St. Paul, where he left his mark as a diligent and devout student.



For his further priestly studies he entered the Academy of St. Thomas Aquinas run by the Dominicans. He was ordained at the hands of Dom Antonio Brandao.